# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது **EXTRAORDINARY**

අංක 972/4 – 1997 අප්‍රේල් 21 වැනි සඳුද – 1997.04.21

972/4 ஆம் இலக்கம் – 1997 ஆம் ஆண்டு ஏப்பிறல் மாதம் 21 ஆம் திகதி திங்கட்கிழமை

No. 972/4 – MONDAY, APRIL 21, 1997

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது) (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. – බී. 4/96.

### 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සකස් කරනු ලැබූ නියෝග.

ඉන්දික රූපසිංහ ගුණවර්ධන,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1997 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 1997 මසුන් ගොඩබෑමේ නියෝග නමින් හැඳින්වේ.

2. මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයකින් බලය ලබා මිස කවර හෝ පුද්ගලයකු විසින්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ බෝට්ටුවක් මගින් ගෙන එනු ලැබූ යම් මසුන් වර්ගයක්, හැර ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත දී අල්ලනු ලැබූ යම් මසුන් වර්ගයක් ශ්‍රී ලංකාවේ වරායක ගොඩබෑම නොකළ යුතුය.

3. මෙහි 2 වැනි නියෝගයෙහි සඳහන් (මින් මතු "අවසර පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසර පත්‍රය සඳහා වූ ඉල්ලුම්පතක්, අවසර පත්‍රය අවශ්‍ය කරන බෝට්ටුවේ අයිතිකරු විසින් එම උපලේඛනයේ I වැනි කොටසෙහි සඳහන් ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය.

4. අවසර පත්‍රය, මෙහි උපලේඛනයෙහි II වැනි කොටසෙහි දැක්වෙන ආකෘතිය අනුව විය යුතු අතර, අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය සඳහා පමණක් වලංගු විය යුතුය.

1A – D 044392 – 840 (97/04)

5. අවසර පත්‍රය යටතේ ක්‍රියා කිරීමේ දී ආගමන ආඥාපනතේ සහ රේගු ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම අවසරපත්‍රලාභියාගේ වගකීම වේ.

6. අවසර පත්‍රය, බෝට්ටුව ක්‍රියාකරවන සෑම අවස්ථාවක ම එහි තුළ තබා ගත යුතු අතර, අවසර පත්‍ර අංකය, බෝට්ටුවේ දෙපැත්තේ සහ වියනෙහි ද පැහැදිලිව සටහන් කළ යුතුය.

7. අවසර පත්‍රය ගෙනයනු ලබන බෝට්ටුව, අවසර පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ධීවර වරායේ සිට මෙහෙයුම් කටයුතු කරන බවට අවසරපත්‍රලාභියා වග බලා ගත යුතුය.

8. අවසරපත්‍රලාභියා තමාගේ බෝට්ටුව, ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි තරංග පද්ධතියට සම්බන්ධ කළ ගුවන් විදුලි සන්නිවේදන පද්ධතියකින් සමන්විත වන බවට වග බලා ගත යුතුය.

9. අවසර පත්‍රය ගෙනයනු ලබන බෝට්ටුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ස්ථානය නිර්නය කිරීමේ මධ්‍යම පද්ධතියට ට්‍රාන්ස්පොන්ඩරයක් මගින් සම්බන්ධ වී පවතින බවට අවසරපත්‍රලාභියා විසින් වග බලා ගත යුතුය.

10. අවසර පත්‍රයක් ඉල්ලීමට අදාළ බෝට්ටුව, අධ්‍යක්ෂවරයාගේ බලයලත් නිලධරයකුගේ මූලික පරීක්ෂණයකට ඉදිරිපත් කළ යුතුය. ඉන්පසු අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද තැනැත්තකු මාර්ගයෙන් වරින් වර බෝට්ටුව පරීක්ෂාවට භාජනය කළහැකි වන අතර, එහි අයිතිකරු එවැනි තැනැත්තකු විසින් පරීක්ෂණය පැවැත්වීම සඳහා ඉඩදිය යුතුය.

11. මසුන් ඇල්ලීමේ සෑම මෙහෙයුමක් අවසානයේ දී ම, ඇල්ලූ මසුන් ප්‍රමාණය පිළිබඳ දත්ත හා අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලනු ලබන වෙනත් තොරතුරු බෝට්ටුවේ අයිතිකරු විසින් අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කළ යුතුය.

12. මේ නියෝගවල "ශ්‍රී ලංකා ජලතීරය" යන්නෙහි 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

## උපලේඛනය

### I වැනි කොටස

### මසුන් ගොඩබෑමේ බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය
### (1997 මසුන් ගොඩබෑමේ නියෝග යටතේ ඉදිරිපත් කෙරේ)

1. ඉල්ලුම්කරුගේ / සමාගමේ සම්පූර්ණ නම: ————.

   (අ) විදේශීය ලිපිනය: ————.

   දුර ඇමතුම් අංකය: ————.

   ෆැක්ස් අංකය: ————.

   (ආ) දේශීය ලිපිනය: ————.

   දුර ඇමතුම් අංකය: ————.

   ෆැක්ස් අංකය: ————.

2. බලය ලත් දේශීය නියෝජිතයාගේ සම්පූර්ණ නම: ————.

   දේශීය ලිපිනය: ————.

   දුර ඇමතුම් අංකය: ————.

   ෆැක්ස් අංකය: ————.

3. යාත්‍රාව අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය: ————.

4. යාත්‍රාවේ නම: ————.

5. ලියාපදිංචි අංකය සහ ලියාපදිංචි වූ රට: ————.

6. යාත්‍රාවේ විස්තරය:

(අ) මුළු දිග: ——————.

(ආ) පළල: ——————.

(ඇ) දියේ කිඳෙන ප්‍රමාණය: ——————.

(ඈ) නැව් කඳ තනා ඇති ද්‍රව්‍යය: ——————.

(ඉ) යාත්‍රාවේ රක්ෂණකරු: ——————.

(ඊ) ගුවන්විදුලි සනිවුඩ සංඥාව: ——————.

7. යාත්‍රාවේ පැටවුම් ටොන් බර:

(අ) දළ බර ටොන්: ——————.

(ආ) ලියාපදිංචි ශුද්ධ බර ටොන්: ——————.

8. යාත්‍රාවේ උපකරණ:

(අ) ඇන්ජිම – ප්‍රධාන ඇන්ජිම:

නිෂ්පාදනය: ——————.

අ.බ.: ——————.

උපයෝගී ඇන්ජිම:

නිෂ්පාදනය: ——————.

අ.බ.: ——————.

(ආ) ශීතකරණ උපකරණ: ——————.

(ඇ) ඩෙක් උපකරණ: .

(ඈ) විදුලිය හා විද්‍යුත් උපකරණ: ——————.

(ඉ) ධීවර ආම්පන්න: ——————.

9. යාත්‍රාවේ ධජය අයත් රට: ——————.

10. යාත්‍රාවේ දේශීය වරාය: ——————.

11. යාත්‍රාවේ පැති අංකය (ධීවර යාත්‍රාව හඳුනාගැනීමේ ලකුණ: ——————.

දිනය:

——————
ඉල්ලුම්කරුගේ අත්සන.

## II වැනි කොටස

### මසුන් ගොවිබෑම සඳහා බලපත්‍රය
### (1997 මසුන් ගොවිබෑමේ රෙගුලාසි යටතේ නිකුත් කෙරිණ)

1. ඉල්ලුම්කරුගේ / සමාගමේ සම්පූර්ණ නම : ——————.

(අ) විදේශීය ලිපිනය : ——————.

දුර ඇමතුම් අංකය : ——————.

ෆැක්ස් අංකය : ——————.

(ආ) දේශීය ලිපිනය : ——————.

දුර ඇමතුම් අංකය : ——————.

ෆැක්ස් අංකය : ——————.

2. බලය ලත් දේශීය නියෝජිතයාගේ සම්පූර්ණ නම :————.
දේශීය ලිපිනය :————.
දුර ඇමතුම් අංකය :————.
ෆැක්ස් අංකය :————.

3. යාත්‍රාව අයිතිකරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය :————.

4. යාත්‍රාවේ නම :————.

5. ලියාපදිංචි අංකය සහ ලියාපදිංචි වූ රට :————.

6. යාත්‍රාවේ විස්තරය :—

(අ) මුළු දිග :————.
(ආ) පළල :————.
(ඇ) දියේ කිමිදෙන ප්‍රමාණය :————.
(ඈ) නැව් කඳ තනා ඇති ද්‍රව්‍යය :————.
(ඉ) යාත්‍රාවේ රක්ෂණකරු :————.
(ඊ) ගුවන්විදුලි පණිවුඩ සංඥාව :————.

7. යාත්‍රාවේ පැටවුම් ටොන් බර :—

(අ) දළ බර ටොන් :————.
(ඇ) ලියාපදිංචි ශුද්ධ බර ටොන් :————.

8. යාත්‍රාවේ උපකරණ :—

(අ) ඇන්ජිම ප්‍රධාන ඇන්ජිම :
නිෂ්පාදනය :————.
අ. බ. :————.
උපයෝගී ඇන්ජිම :
නිෂ්පාදනය :————.
අ. බ. :————.

(ආ) ශීතකරණ උපකරණ :————.
(ඇ) ඩෙක් උපකරණ :————.
(ඈ) විදුලිය හා විද්‍යුත් උපකරණ :
(ඉ) ධීවර ආම්පන්න :————.

9. යාත්‍රාවේ ධජය අයත් රට:————.

10. යාත්‍රාවේ දේශීය වරාය :————.

11. යාත්‍රාවේ පැති අංකය (ධීවර යාත්‍රාව හඳුනාගැනීමේ ලකුණ):————.

............................................යන ස්ථානයේ මසුන් ගොඩබෑමට සහ ශ්‍රී ලංකා ජලතීරුවෙන් පිටතට මසුන් රැගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ. මෙම අවසර පත්‍රය ..............................දිනයට මාස ..............කාලසීමාවකට වලංගු වේ. අවසර පත්‍රයේ කොන්දේසිවලින් කිසිවක් අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් අවසර පත්‍රය අවලංගු කිරීමට සිදුවනු ඇත.

..............................
අධ්‍යක්ෂ,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

දිනය :

05 – 45